# ජපන් සංස්කෘතියේ කැපී පෙනෙන අංගයක් - තේ සාදය






සම්මානිත මහාචාර්ය
කුසුමා කරුණාරත්න

ජපානය වූ කලී, සතර වටින්ම සාගරයෙන් වෙන් වූ දූපත් සමූහයකින් සමන්විත රටකි. හොක්කයිදෝ, හොංෂු, ශිකොකු, කියුෂු යන ප්‍රධාන දූපත් හතරට අමතරව, ජපන් රටට අයත් වන වෙනත් කුඩා දූපත් දහසක් පමණ වෙයි. ලෝකයේ සෙසු රටවල් සමග සසඳන විට ජපානය බොහෝ විශේෂ ලක්ෂණවලින් යුක්ත බව පෙනේ. සැකෙවින් දක්වතොත් ජපානය, ඊටම ආවේණික වූ විශේෂ සංස්කෘතියක් ඇති, විශේෂ ජාතියක් සිටින අනන්‍ය වූ රටකි. තවද ජපානය දූපත් රාජ්‍යයක් ද වෙයි. දීර්ඝකාලීන වශයෙන් ගෙන බලන විට, එරටට දිගින් දිගටම වෙනත් රටවල ආභාසය ලැබුණ නමුදු ඒ සියල්ලෙන් පෝෂණය ලබමින් ස්වීය ලක්ෂණ මතු කෙරෙන, නැතහොත් ජපන් බව මතු කොට පෙන්වන සංස්කෘතියකට උරුමකම් කියන අභිමානවත් ජාතියක් ලෙස ජපන් ජාතිකයෝ ලෝක ප්‍රජාව අතර විශේෂත්වයක් උසුලති.

වර්තමානයේදී ජපානය ගැන සලකන විට, බැලූ බැල්මටම එය බටහිර ආභාසය ලත් රටක් ලෙස පෙනෙනු ඇත. එහෙත් ජපන් සංස්කෘතියේ අභ්‍යන්තරය, එහි හරය ගෙන බලන විට පැහැදිලි වනුයේ ජපානය, සම්ප්‍රදායයන්හි ඇලී ගැලී ජීවත් වන ජනතාවකගේ එකතුවක් ලෙසිනි. මතු පිට තලයට යටින් පවතින සාම්ප්‍රදායික සිරිත් විරිත්, ආකල්ප හා විශ්වාසයන්ගෙන් එරට සංස්කෘතිය සවිමත් වී ඇත. ජපන් සංස්කෘතිය, පිළිබඳ පුළුල් අවබෝධයක් ලැබීම සඳහා ඔවුන් සතු සාම්ප්‍රදායික සංස්කෘතිය, ඇදහිලි විශ්වාස, හැසිරීම් රටා, සිරිත් විරිත්, ජාතික උත්සව යනාදිය පිළිබඳ හැදෑරීමක් කළ යුතුය. මතුපිටින් ගෙන බලන විට ජපන් වැසියන් අතුරින් බහුතරයක් නූතන තාක්ෂණ දියුණුවේ ප්‍රතිඵල භුක්ති විඳින, ඒ හා සම්බන්ධ භාණ්ඩ හා පහසුකම් පරිහරණය කරන පිරිසක් බව පෙනේ. ඔවුන් සතු ව්‍යාපාර, නව නිෂ්පාදන ආදී අංශවලින් නූතන ලෝකයේ ඉදිරියටම ගොස් සිටින ජාතියක් ලෙස ජපන් ජාතිකයන් හඳුන්වා දීම නිවැරදිය. එසේ වුවද, මූලික පදනම අතින් බලන විට, ආගමික හා සංස්කෘතික වශයෙන් ඔවුන් සාම්ප්‍රදායික ජන සමාජයක් බව පෙනේ.

ජපන් ජාතිකයන් වසර පුරාම පිළිපදින විවිධ චාරිත්‍ර වාරිත්‍ර මෙන්ම සිදු කරන නානාප්‍රකාර උත්සව රාශියක් ඇත. ඒ අතුරෙන්, ඔවුන්ගේ බසින් 'චනොයු', 'චදො', 'සදො', යන වචනවලින් හඳුන්වනු ලබන තේ සාදය පිළිබඳ උත්සවය ජපන් සංස්කෘතියේ විශේෂ ස්ථානයක් උසුලයි. මේ හැරුණු විට මුළු වසර පුරාම එරට වැසියන් උත්සවාකාරයෙන් පවත්වන වෙනත් චාරිත්‍ර වාරිත්‍ර ද බොහෝ වෙයි. ලෝකයේ ජීවත් වන විවිධ ජන කොටස් සමග සසඳා බලන විට ජපන් ජාතිකයෝ මළවුන් වෙනුවෙන් විශේෂ වූ වතාවත් රාශියක් ඉටු කරති. 'ඕ-බොං' උත්සවය, නැතහොත් 'මළවුන්ගේ අවුරුදු සමය' සිහි කරමින් පවත්වන විවිධ වතාවත් හා චාරිත්‍ර ඔවුන් අද පවා ඉටු කරන්නේ ඉමහත් භක්තියකිනි.

මළවුන් වෙනුවෙන් ජපන් ජාතිකයන් තරම් උද්යෝගයකින් සිය යුතුකම් හා වගකීම් ඉටු කරන වෙනත් ජාතියක් ලොව ඇද්ද යන්න සිතාගන්නට බැරි තරම්ය. මළවුන්ගේ අවුරුදු සමය සාමාන්‍යයෙන්, වසරේ ජූලි, අගෝස්තු යන කාල සීමාවේදී සමරනු ලැබේ. 'බොං' උත්සවය නමින් හැඳින්වෙන මෙය, ජපන් ජාතිකයන්ගේ සාමාන්‍ය ව්‍යවහාරයේදී යෙදෙන ගෞරවාන්විත 'ඕ' යන්න මුලට යොදාගනිමින්, 'ඕ-බොං' යන නමින් හැඳින්වෙයි. 'ඕ-බොං' යන්න ජපානයේ බෞද්ධාගමික අනුස්මරණ දිනය ලෙස ද සැලකෙයි. 'ඕ-බොං' යන්න 'උර-බොං' යන්නෙහි කෙටි යෙදුමකි. සංස්කෘතක 'උල්ලම්බන' යන්නෙන් බිඳී ආ පදයක් ලෙස ද මෙය සලකනු ලැබේ.

සාමාන්‍යයෙන් ජපන් වැසියන් මළවුන් පිදීමේ චාරිත්‍ර ඉටු කරන 'ඕ-බොං' උත්සව ආරම්භ කරනුයේ ජූලි මස දහතුන්වන දින බව කියවෙයි. එතැන් පටන් දින හතරක් පුරා අදාළ වතාවත් සිදු කරනු ලැබේ. නිවෙස් තුළ ඥාතීන් එක්රැස් වී මළවුන් සිහි කරමින් වතාවත් සිදු කිරීම දැකගත හැකිය. විශේෂ ආහාරපාන අනුභවය සමග, සියල්ලන් එකතු වීමේ ප්‍රීතිය භුක්ති විඳගැනීම ද මේ අතර සිදු වෙයි. තම මිය ගිය ඥාතීන්ගේ ආත්මයන් නිවසට කැඳවාගැනීමක් අපේක්ෂා කෙරෙන මෙම උත්සවයේදී මළ ගියවුන් උදෙසා ආහාරපාන සහ වෙනත් බොහෝ දේ සූදානම් කර තබනු ලැබේ. සෑම ජපන් නිවසකම විශේෂයෙන් පිළියෙල කෙරෙන අල්තාරයක් මත විවිධ දේ තබනු ලබන්නේ ද මළවුන් වෙනුවෙනි. පවුලේ ඥාතීන් විසින් සිදු කරනු ලබන ආගමික හා සංස්කෘතික වතාවත්වල මෙන්ම ඒ සඳහා යොදාගැනෙන දේවල ද ඔවුන්ගේ විශ්වාසවලටම ආවේණික වූ දේ දැකගත හැකිය. නිදසුන් ලෙස ගතහොත්, වම්බටු වැනි එළවළු වර්ගවලට කෝටු කැබලි වැනි දේ සවි කොට වාහනවල ස්වරූපයෙන් අල්තාරය මත තබන අවස්ථා මෙම කාල වකවානුවේදී දැකගත හැකිය. මළවුන්ගේ ආත්මයන් තම නිවසට පැමිණ ආපසු යන ගමනේදී ගමන් වෙහෙස නොදැනෙන්නට ඔවුන් වෙනුවෙන් වාහන සපයා දීමක් මෙමගින් සංකේතාත්මකව දැක්වෙයි. ඇතැම් විට පිදුරු තොප්පි, සැරයටි, පිදුරුවලින් ගොතා සැකසූ පාවහන් මෙන්ම කාසි කිහිපයක් ද එලෙසට සූදානම් කර තබන්නේ ද ආපසු සිය වාසස්ථාන කරා පා ගමනින් යන තම මළවුන්ගේ ආත්මවලට එම ගමන පහසු වීමට සපයා දෙන දේ සංකේතවත් කරමිනි. මළවුන්ගේ අවුරුද්ද සැමරීම අවසානයේදී සාමූහිකව පැවැත්වෙන ප්‍රීති උත්සවයක් ලෙස 'බොං ඔදොරි' නමින් නැටුම් විශේෂයක් ද පැවැත්වෙයි. සියල්ලන් එකතුව, බෙර පද අනුව විශේෂ ලීලාවකින් පාද තබමින්, සිරුර ද ඒ අනුව චලනය වන සේ පැවැත්වෙන මෙම උත්සවය මනහර දර්ශනයකි.

මේ හැරුණ විට ජපන් සංස්කෘතියේ විශේෂ අංගයක් වන තේ සාදයට ද අමතරව වෙනත් සංස්කෘතික අංග රාශියක් දක්නට ඇත. 'හනමත්සුරි', 'හනමි', 'තනබත' උත්සවය ආදී වශයෙන් එම උත්සව හැඳින්වේ. සකුරා මලේ සුන්දරත්වයෙන් බැබළෙන ජපානයේ වැසියන් සකුරා මල් පිපෙන කාලයට ඒවායේ සෞන්දර්යය විඳගනිමින්, ප්‍රීති ප්‍රමෝදයෙන් යුතුව විවේකීව එහි සතුට භුක්ති විඳින ආකාරය දැක ගත හැකිය. 'මත්සුරි' යන ජපන් වචනය 'උත්සවය' යන අරුත හඟවන අතර 'හන' වනු මල්වලට යෙදෙන වචනයයි. 'මල් උත්සවය' යනුවෙන් හැඳින්වෙන 'හනමත්සුරි', වසරේ අප්‍රේල් මස මුල් දින කීපය තුළ පවත්වනු ලබන්නකි. මෙහි ආගමික අරුතකුත් ඇත. එනම් ඔවුන් සලකන පරිදි බුදුන් වහන්සේගේ උපත සැමරීමක් ද මෙයින් සිදු වෙයි.

ජපන් බසින් 'හන' යන්නෙන් 'මල්' යන අරුත හැඟවෙන අතර 'හින' යනු 'බෝනික්කා' යන්න හැඟවෙන පදයයි. 'හිනමත්සුරි' යනු 'බෝනික්කන්ගේ උළෙල'යි. අන් බොහෝ රටවල නොමැති අන්දමේ ආගමික හා වෙනත් උත්සව ජපන් සංස්කෘතිය තුළ දැකගත හැකි බවට මෙකී උත්සව නිදසුන් සපයයි. ගැහැනු දරුවන්ට සමීප වන්නක් ලෙස සැලකෙන 'බෝනික්කා' මෙහිදී ගැහැනු ළමයින්ගේ උත්සවය හා සම්බන්ධ කෙරෙයි. මෙම උත්සවය ගැන විවිධාකාර අර්ථකථන ද වෙයි. මෙය සැමරෙන අවස්ථාව සඳහා, ගැහැනු ළමයින් සිටින නිවෙස්වල ඒ වෙනුවෙන් විශේෂ අල්තාරයක් සැකසෙයි. උඩ සිට පහළට වන සේ තට්ටු කිහිපයක් ඇති මෙහි එක් එක් තට්ටුවල තබනු ලබන බෝනික්කන් හුදෙක් ක්‍රීඩා භාණ්ඩම නොවේ. ඉහළම තට්ටුවේ අධිරාජ්‍යයා සහ රාජිනිය ලෙස සැකසූ බෝනික්කන් තැන්පත් කෙරේ. ඒවා දෙපසින්, ප්‍රභූ පන්තියේ අය, නැතහොත් රජ මාලිගාවේ සෙසු අය ලෙස පෙන්වනු ලබන තවත් බෝනික්කන් තැන්පත් කෙරෙන අතර එම සීමාව පීච් පලතුරු ගසේ පිපෙන මල්වලින් අලංකාර ලෙස සකසනු ලැබේ. පහතින් ඇති තට්ටුවල ද විවිධ වර්ණවත් බෝනික්කන් රැසක් තැබීමෙන් අලංකාර දර්ශනයක් ඉදිරිපත් කිරීම ජපන් ජාතිකයන් 'හිනමත්සුරි' උත්සවයේදී කරනු ලබන්නකි. එම උත්සවයට විශේෂ වූ ආහාර වර්ග අනුභව කිරීම හා සෙස්සන්ට සංග්‍රහ කිරීම ද මෙහිදී සිදුවෙයි. ගැහැනු දරුවන් උදෙසා පැවැත්වෙන මෙම උත්සවයට අමතරව පිරිමි ළමයින් වෙනුවෙන් පැවැත්වෙන උත්සවයක් ද ජපන් සංස්කෘතික අංගවලට අයත් වෙයි.

මේ සියලු උත්සවවල යම් තරමක් දුරට ආගමික අරුතක් ද ඇති අතර වැඩි වශයෙන්ම සාම්ප්‍රදායික සංස්කෘතික උත්සව ලෙස මේවා පැවැත්වෙයි. මේ උත්සවයන්ට සමගාමීව ජපන් ජනතාව විශේෂයෙන්ම පවත්වනු ලබන 'චනොයු' නම් වූ 'තේ සාදය' නැතහොත් 'තේ උත්සවය' ජපන් සංස්කෘතියේ කැපී පෙනෙන ස්ථානයක් හිමි කරගෙන ඇත. නූතන දේ ඉගෙනීමට හා ක්‍රියාවට නැංවීමට නොපසුබට වන ජපන් ජනයා සිය සාම්ප්‍රදායික සංස්කෘතික ලක්ෂණ ද වියැකී යා නොදී රැකගන්නා ආකාරය පෙන්වීමට ද තේ සාදය කදිම නිදසුනකි. ඇතැමුන්ගේ මතය අනුව බටහිර සංස්කෘතියේ විශේෂ තැනක් දරන 'බටහිර සාම්ප්‍රදායික මුද්‍රා නාට්‍ය' හා ජපන් ජාතිකයන්ගේ සාම්ප්‍රදායික තේ සාදය පිළිබඳව පෙනෙන විශේෂ ලක්ෂණ ඇත. මේ අංග දෙකෙහිම විශේෂයෙන් පිළිපැදිය යුතු නීති රීති තිබේ. තවද, එම නීති රීති ගැන හොඳ අවබෝධයක් ඇතොත් මිස මෙම අංග දෙකම එක තරමටම ඒකාකාරී මෙන්ම නැරඹීමට වෙහෙසකර වූ ද ඒවාය. මේ දෙකෙහිම එක හා සමාන නීරස ගතියක් ඇති බව ද මෙවන් අදහස් පළ කරන්නන්ගේ මතයයි. එබැවින් නිශ්චිත නීති රීති හා බැඳුණ යම් කිසි විචිත්‍රවත් අංග හෝ නරඹන්නන්ගේ සිත් ඇදගන්නා යමක් ඇතුළත් නොවුවහොත් නීරස බවක් ඇති විය හැකි ඒවාය. ජපන් ජාතිකයන්ගේ තේ සාදය ගැන විශේෂයෙන් සඳහන් කරන විට එහි ආරම්භයේ සිට අවසානය දක්වා, සාදය පවත්වන්නන් මෙන්ම නරඹන්නන් ද එහි අන්තර්ගත නීතිරීති ගැන ප්‍රමාණවත් දැනුමකින් යුක්ත විය යුතු බව කිව හැකිය. බටහිර මුද්‍රා නාට්‍ය නැරඹීමේදී සිදු වනවාට වඩා තේ සාදය පැවැත්වීමේදී සහභාගි වන්නන් ද ඉටු කළ යුතු කොටසක් තිබීම නිසා ඒකාකාරී හා නීරස බව අවම කරගත හැකිය.

ජපන් තේ සාදයේදී එය සිදු කරන්නන් හා සමග මනසින් සම්බන්ධ වෙමින් සහභාගි වන්නන්, නැතහොත් ආරාධිතයන් ද කිසියම් කාර්ය භාරයක් සිදු කරනු ඇත. 'චනොයු' උත්සවයකදී සැබවින්ම සිදු වන්නේ කොළ පැහැති තේ උණු වතුර හා මුසු කොට තේ පිළියෙල කර, ආරාධිතයින්ට පිළිගැන්වීම චාරිත්‍රානුකූලව, ඉතා සියුම් විස්තර ද සහිතව ක්‍රියාත්මක වීමයි. පසළොස්වන සියවසේ අග භාගයේදී තේ සාද පැවැත්වූ, ඒ සඳහා නම් දැරූ, ප්‍රකට පුද්ගලයන් කිහිප දෙනකු විසින් ප්‍රභූ සමාජයේ සුඛෝපභෝගී ආහාරපාන සහිත ජීවන රටාවට වෙනස් මගක යමින්, අල්පේච්ඡතාව මතු කර ලීමට ගනු ලැබූ පියවරක්, තේ සාදය මෙලෙසින් ජපන්

